# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1203/9 – 2001 සැප්තැම්බර් 24 වැනි සඳුදා – 2001.09.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී – බී. 21/78.

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1995 අංක 1 දරන පනතින් අවසන්වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2001 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය 2001 අංක 3 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතු ය.

2. අංක 1155/20 හා 2000 ඔක්තෝබර් මස 27 වන දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 2000 අංක 4 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලියෙන් අවසන් වරට සංශෝධිත අංක 83/7 හා 1980 අප්‍රේල් මස 10 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 13 වන ඡේදයේ (ඩ) අනුඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන (ණ) අනුඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ණ) කාම ව්‍යාධි වේදය".

(2) එහි 14 වන ඡේදයෙහි–

(i) ඒ ඡේදයේ (2) (ඈ) (iii) අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :–

" (iii) සායනික නියෝප්ලාස්මවේදය සහ කාම ව්‍යාධිවේදය යන විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන්, ඒ ඡේදය 2(ඈ) (1) අනුඡේදයේ සඳහන් අභ්‍යාස මධ්‍යස්ථානවලින් නියෝජිතයන් නවදෙනෙක් ; ඔවුන් අතරින් යටත් පිරිසෙයින් තිදෙනකු –

(අ) මහරගම පිළිකා ආයතනය සහ

(ආ) මධ්‍යම එස්. ටී. ඩී. සායනය

යන ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානවලින් විය යුතුය.".

(ii) ඒ ඡේදයේ (3) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :–

"(3) එම (1) සහ (2) වන අනුඡේදවල සඳහන් අධ්‍යයන සභාවේ සියලුම සාමාජිකයන් පුහුණුකරුවන් විය යුතු අතර පවුල් වෛද්‍ය සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය සහ කාම ව්‍යාධි වේදය යන විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් හැර පුහුණුකරුවකු මණ්ඩලය විසින් සහතික කරනු ලැබීම සඳහා වූ වරප්‍රසාදවලට සුදුසුකම් ඇති බවට මණ්ඩලය විසින් සහතික කරනු ලැබීමෙන් පසු අවුරුදු තුනක පළපුරුද්ද හෝ පාර සායනික වෛද්‍ය ක්ෂෙත්‍ර සම්බන්ධයෙන් වනවිට වෛද්‍ය විශාරද උපාධිය (එම්. ඩී.) හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන සුදුසුකම් ලබාගැනීමෙන් පසු අවුරුදු පහක පළපුරුද්ද හෝ අදාළ ක්ෂේත්‍රයේ පුහුණුකරුවකු වශයෙන් අවුරුදු තුනක පළපුරුද්ද ලබාගත් තැනැත්තකු විය යුතු ය.

එසේ වුවද, කාම ව්‍යාධි වේදයට අදාළ වනුයේ ප්‍රජා වෛද්‍ය ක්ෂේත්‍රයයි. කාම ව්‍යාධිවේදය පිළිබඳ පුහුණුකරුවකුවනුයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කාම ව්‍යාධි වේදය පිළිබඳ විශේෂඥයකු ලෙස පිළිගනු ලැබූ තැනැත්තකු හෝ අනුමත පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක කටයුතු කරන වෙනත් ක්ෂේත්‍රයක විශේෂඥවරයෙකි.

එසේ වුවද, තවදුරටත් (1) (ඇ) අනුඡේදයෙහි සහ (2) (ඇ) අනුඡේදයෙහි සඳහන් පුහුණු මධ්‍යස්ථාන නියෝජිතයන්, අවස්ථාවෝචිත පරිදි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ පුහුණු මධ්‍යස්ථානවල පුහුණුකරුවන් විසින් තෝරා ගනු ලැබිය යුතුය. එසේ තෝරාගනු ලැබූ තැනැත්තන්ගේ නම් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ අධ්‍යක්ෂකවරයා විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.".

(3) 25 වන ඡේදයේ "වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙහි අර්ථකථනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :–

" "වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙන් නිර්වින්දන වෛද්‍ය වේදය, ප්‍රජා වෛද්‍ය විද්‍යාව, පවුල් වෛද්‍ය සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තීය, වෛද්‍ය විද්‍යාව, ධාත්‍රිනෘත්‍යය සහ නාරිවේදය, චක්ෂුවේදය, ව්‍යාධිවේදය, කෞමාරභෘත්‍යය, මනෝභෘත්‍යය, විකිරණවේදය, ශල්‍යය, අධිකරණ වෛද්‍ය විද්‍යාව, ක්ෂුද්‍රාජේවවේදය, කන්ඨස්වරාලවේදය, විකිරණ චිකිත්සාව, නියෝප්ලාස්මවේදය, දන්ත ශල්‍යය, වෛද්‍ය පරිපාලනය, සෞඛ්‍ය විද්‍යා, චර්මවේදය සහ කාම ව්‍යාධිවේදය හෝ ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් විශේෂඥ ක්ෂේත්‍රයක් අදහස් කෙරේ.".

10 – 221/1

එල්. ඩී. – බී. 21/78

---

## 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1995 අංක 1 දරන පනතින් අවසන්වරට සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2001 සැප්තැම්බර් මස 12 වැන දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය, 2001 අංක 2 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර 2001. 10. 01 දිනදී බලාත්මක විය යුතුය.

2. අංක 68/11 හා 1979 දෙසැම්බර් 26 වන දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද, වරින්වර සංශෝධිත පරිදි වූ 1979 අංක 9 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන නියමාවලිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි 10 වන ඡේදය :–

(i) ඒ ඡේදයේ 1 (ග) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :–

"(ග) පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලද සේ සැලකෙන විශ්ව විද්‍යාලවල කෘෂිකර්ම පීඨයේ සහ පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ පීඨවල පීඨාධිපතිවරුන් හෝ ඔවුන්ගේ නාමිතයන් ."

(ii) ඒ ඡේදයේ (2) (අ) වන අනුඡේදයේ 'එක් සාමාජිකයකු' යන වචන වෙනුවට 'එක් එක් විශේෂඥ ක්ෂේත්‍රයේ එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු' යන වචන ආදේශ කිරීමෙන්.

3. එහි 13 වන ඡේදයේ (එ) වන අනුඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :–

"(එ) ජෛව සංඛ්‍යාලේඛන".

4. එහි 14 වන ඡේදයේ, 1 (ඈ) අනුඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :–

"(ඇ) මේ පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලද සේ සැලකෙන එක් එක් විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයෙන්, පීඨ මණ්ඩලය විසින් තිදෙනකු නොඉක්මන පරිදි එහි සාමාජිකයන් අතුරින් නම් කරනු ලබන. එක් එක් විශේෂඥ ක්ෂේත්‍රයේ එක් ජ්‍යෝෂ්ඨ මහාචාර්යවරයෙක්, මහාචාර්යවරයෙක් හෝ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරයෙක් .".

10 - 221/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.